රුහුණ විශ්වවිද්‍යාලය - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

**<u>ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණය -2014 සඳහා</u>**

**<u>අයදුම්පත් කැඳවීම</u>**

1. 2014/2015 වර්ෂයන්ට නියමිත ඉහත සඳහන් පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් ප්‍රථමවර අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මෙතෙක් පුනර් (Repeat) අයදුම් නොකළ අපේක්ෂක අපේක්ෂිකාවන් සඳහා ද අයදුම් කළ හැකිය.

3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2016.07.26** දින බැවින්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදිනට හෝ ඊට පෙර ලැබෙන සේ " **සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම හා වර්ෂය සඳහන් කළ යුතුය.**

4. පරීක්ෂණ සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති අය විසින් හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ එවනු ලබන සියලුම අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ.

5. පරීක්ෂණයට පෙනී සිටින විෂයයන්, පත්‍ර නාමය හා පත්‍ර සංකේතය අයදුම්පතෙහි සටහන් කරන්න.

6. පරීක්ෂණ ගාස්තු ගෙවීම.

   පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා නියමිත බැංකු වවුචර් පත් දෙකක් විභාග අයදුම්පත සමඟ ඇත. අදාළ මුදල් බැංකු වවුචර් පත් මඟින් මහජන බැංකුවේ උයන්වත්ත ශාඛාවේ අංක 032-1-001-1-2477594 දරණ රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා බැංකුව විසින් ආපසු දෙනු ලබන වවුචර් පත ගාස්තු ගෙවූ කුවිතාන්සිය වශයෙන් අයදුම්පතට අමුණා එවිය යුතුය. අදාළ පරීක්ෂණ සඳහා ලියාපදිංචි වන හා ලියාපදිංචිය දීර්ඝ කිරීමට අවශ්‍ය සිසුන් ද මතු සඳහන් පරිදි අදාළ මුදල් ගෙවිය යුතුය. මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් බාර ගනු නොලැබේ.

7. අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර අදාළ පරිදි අයදුම්පතේ සඳහන් කළ යුතුය.

   <u>නියමිත විභාග ගාස්තු</u>

   | | |
   |---|---|
   | ප්‍රථම වර පෙනීසිටීම සඳහා | රු. 4000.00 |

   **අසමත් ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටින විට**

   | | |
   |---|---|
   | අසමත් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා | රු. 1000.00 |

8. ඉල්ලුම් පත්‍රය සමඟ බැංකු කුවිතාන්සිය හා ඔබගේ නම, ලිපිනය ලියන ලද 9" x 4" ලිපි කවර දෙකක් අමුණා එවිය යුතු අතර එම ලිපිකවරවල ඉහළ වම් කෙළවරේ ඔබගේ ලියාපදිංචි අංකය ද සඳහන් කළ යුතුය.

ඩබ්. ඩබ්. අනුර

සහකාර ලේඛකාධිකාරී,

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය.

2016.07.07